ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

Learning Resource Center

## කතෝලික ධර්මය

09.05.2025

පළමු වාර පරීක්ෂණය - 2025 | 8 ශ්‍රේණිය | කාලය පැය 02

❖ අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. ලූක් තුමාගේ සුවිශේෂයේ ප්‍රධාන අරමුණ කුමක්ද?
 I. ජේසුස් වහන්සේගේ ද්‍රුදෙව් අනන්‍යතාවය අවධාරණය කිරීමට
 II. ජේසුස් වහන්සේ සියලු මනුෂ්‍ය වර්ගයාගේ ගැලවුම්කරුවා ලෙස පෙන්වීමට
 III. ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම් කෙරෙහි අවධානය යොමු කිරීමට
 IV. ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් ඉස්මතු කිරීමට

02. ශු. ලූක් තුමාගේ සුවිශේෂයේ දයාවේ ශුභාරංචියට උදාහරණයක් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
 I. ජේසුස් වහන්සේ අන්ධයෙකු සුව කිරීම  II. යහපත් සමරිතානුවරයාගේ උපමාව
 III. ජේසුස් වහන්සේගේ නැවත නැගිටීම  IV. කන්ද උඩ දේශනාව

02. ශු. ලූක් තුමාගේ වෘත්තියක් නොවන්නේ කුමක්ද?
 I. වෛද්‍යවරයෙක්  II. මිෂනාරිවරෙක්
 III. ඉතිහාසඥයෙක්  IV. ලේඛකයෙක්

03. "දෙවියන් වහන්සේ අප සමඟය" යන්නට අදාළ නාමය කුමක්ද?
 I. එම්මානුවෙල්  II. ජේසුස්
 III. ජෙරමියා  IV. නාතාන්

04. සෙකරියස් තුමා ගොළු වීමට වීමට හේතුව කුමක්ද?
 I. ඔහු දේව මාලිගාවේ වැඩ කටයුතු නිසි ආකාරව නොකිරීම නිසා
 II. ඔහු නීතිය උල්ලංඝනය කළ නිසා
 III. දේව දූතයා කී දේ විශ්වාස නොකළ නිසා
 IV. ඔහු පූජක වාරය නොකළ නිසා

05. පාපයට වැටුණු මිනිසා සඳහා දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව කුමක්ද?
 I. නව වගන්ති පනතක් දීම.  II. නව උත්සාහයක් ලබාදීම.
 III. ගැලවුම්කරුවෙකු එවීමට.  IV. නව සම්ප්‍රදායක් ලබාදීමට.

06. දෙවියන් වහන්සේ ගැලවීමේ ඉතිහාසය ආරම්භ කිරීමට කැඳවූ පුද්ගලයා කවුද?
 I. නෝහා  II. මෝසෙස්
 III. යෙසයා  IV. ආබ්‍රහම්

07. "මා මෙය දැනගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි. මාගේ භාර්යාව ද වයස්ගතව සිටී." මෙම වදන් දේවදූතයාට පවසන ලද්දේ,
 I. ජොහාන් විසිනි.  II. සෙකරියස් විසිනි.
 III. ජෝශප් විසිනි.  IV. ආබ්‍රහම් විසිනි.

08. ලූක් ශුභාරංචියේ ජේසුස් වහන්සේගේ වංශාවලිය ආරම්භ වී ඇත්තේ?
 I. මෝසෙස් තුමාගෙන්  II. ආබ්‍රහම් තුමාගෙන්
 III. ආදම්ගෙන්  IV. දාවිත් තුමාගෙන්

09. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරන්නේ,
I. සමාරියෙනි.
II. ගලීලයෙනි.
III. ජුදයෙනි.
IV. පලස්තීනයෙනි.

10. ශුභාරංචි ග්‍රන්ථවල ඉතාමත් වැදගත් කොටස වන්නේ,
I. ක්‍රිස්තුස් වහන්සේගේ මරණය
II. පාස්කු අභිරහස
III. ක්‍රිස්තුස් වහන්සේගේ උපත
IV. අන්‍යරූප විලාස වීම.

❖ අංක 11-15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "×" ලකුණ ද යොදන්න.

11. මතෙව් තුමාට අනුව ජේසුස් වහන්සේගේ වංශාවලිය ආරම්භ වන්නේ ආදම්ගෙන්ය. ( )
12. ස්නාවක ජොහාන්තුමාගේ දේව කාර්යය වූයේ ජේසුස් වහන්සේගේ පෙර මග සූදානම් කිරීමය ( )
13. "නියමිත පමණට වැඩියෙන් අයබදු නොගන්න" යනුවෙන් ස්නාවක ජොහාන් තුමා අනුශාසනා කරනුයේ ප්‍රභූවරුන්ට ය. ( )
14. ලූක් ශුභාරංචි කතුවරයාගේ ලිවීම හැර වෙනත් කුසලතා දක්නට නොලැබේ. ( )
15. ජුදා සමාජය අයකැමියන් පව්කරුවන ලෙස සලකා කොන් කළහ. ( )

❖ අංක 16-20 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

16. ලූක් ශුභාරංචිය යොමු කර ඇත්තේ .............................. නමැති කැනැත්තා වෙතය.

17. ජේසුස් වහන්සේ උපත ලබන්නේ ..............................නගරයේ යැයි මීකා දෙවැනි 5:2-5 පදවල සඳහන් වේ.

18. ලූක් පමණක් මා සමඟ සිටී. .............................. ඔබ සමඟ කැඳවාගෙන එන්න.

19. ගාබ්‍රියෙල් දේව දූතයා මරියට පවසා ඇත්තේ "සමිඳාණන් වහන්සේ .............................. " යැයි ය.

20. තමන් සතු දෙය .............................. පරිහරණය කළ යුතුය.

(එඬේරුන්ට, ආදම්ගෙන්, මාක්, වගකීමෙන්, ඔබ සමඟ ය, අප සමඟ ය, පව්කරුවන්, තියෝපිලස්, ශාස්ත්‍රවන්තයන්ට, බෙත්ලෙහෙම්, ජෙරුසලම )

## II කොටස

❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න

Learning Resource Center
R
De Mazenod College
Kandana

01.

i. අන්‍ය ජාතිකයන් යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්ද?
ii. ලූක් ශුභාරංචියේ සංකේතය ලෙසගවය භාවිතා වන්නේ අයි?
iii. අසල්වැසියා පිළිබඳව විස්තර කෙරෙන උපමාව කුමක්ද?
iv. ලූක් ශුභාරංචිය කවර කාල වකවානුවකට අයත් වේද?
v. ලූක් ශුභාරංචියේ සඳහන් වන කාන්තාවන් දෙදෙනෙකු සඳහන් කරන්න.
vi. ජේසුස් වහන්සේගේ ළමාවිය පිළිබඳව කරුණු ඉදිරිපත් කල කතුවරුන් දෙදෙනා කවුද?
vii. යෙසායා දිවැසිවරයා ස්නාවක ජුවාම් තුමාව හැඳින්වූ නාමය කුමක්ද?
viii. ජේසුස් වහන්සේ කන්‍යාවකගෙන් පිළිසිඳෙන බව පැවසූ දිවසිවරු දෙදෙනෙක් නම් කරන්න.
ix. ස්නාවක ජොහාන්තුමාගේ දෙමාපියන් නම් කරන්න.
x. ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

02.

i. ශු. සභා සම්ප්‍රදාය අනුව අන්‍ය ජාතික ලූක් තුමන් තම ශුභාරංචිය රචනා කිරීමට කරුණු ලබා ගත්තේ කාගෙන්ද?
ii. ලූක් ශුභාරංචිය හඳුන්වනු ලබන වෙනත් නම් 3 ක් ලියන්න.
iii. අපගේ හැකියා හා දක්ෂතා දෙවියන් වහන්සේගේ මහිමය සඳහා යෙදවිය හැකි අවස්ථා 5ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

03.

i. ලූක් ශුභාරංචියේ පරමාර්ථය ලියන්න.
ii. ලූක් ශුභාරංචියේ පණිවුඩ 3ක් ලියන්න.
iii. ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවෙන් ලැබෙන පණිවිඩය විස්තර කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04.

i. තියෝපිලස් යන්නෙහි අර්ථය කුමක්ද?
ii. ලූක් ශුභාරංචියේ සැලැස්මේ ප්‍රධාන කොටස් තුනක් ලියන්න.
iii. අප ජීවිත දේව සැලැස්ම අනුව ගත කිරීමට මඟ පෙන්වීම ලබා දෙන ලෙස ඉල්ලා යැදුමක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

05.

i. ගැලවුම්කරුවෙකු එවීමට දෙවියන් වහන්සේ පොරොන්දු වූයේ අයි?
ii. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු 3ක් ලියන්න.
iii. දෙවියන් වහන්සේ අපවෙද විවිධ වගකීම් සඳහා කැඳවන ආකාර 5ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

06.

i. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාව තෝරා ගත්තේ අයි?
ii. සෙකරියස් තුමාට පැවරූ වගකීම් 2ක් ලියන්න.
iii. දේව දරුවන් ලෙස ක්‍රියා කරමින් ශු. සභාව පෝෂණය කල හැකි ආකාර 5ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)